වාර්ෂික වාර්තාව සහ ගිණුම්

ஆண்டறிக்கையும் கணக்குகளும்

ANNUAL REPORT & ACCOUNTS

01-04-2021---31-03-2022



ජාතික ලුණු සමාගම

தேசிய உப்பு நிறுவனம்

NATIONAL SALT LIMITED

ජාතික ලුණු සමාගම
தேசிய உப்பு நிறுவனம்
NATIONAL SALT LIMITED

කර්මාන්ත අමාත්‍යාංශය

கைத்தொழில் அமைச்சு

Ministry of Industries

රජයට අයත් සමාගමකි

அரசுக்குச் சொந்தமான கம்பனி

Government Owned Company

වාර්ෂික වාර්තාව සහ ගිණුම්
ஆண்டறிக்கையும் கணக்குகளும்
ANNUAL REPORT & ACCOUNTS

2021.04.01 – 2022.03.31

පටුන

1.	සභාපතිතුමාගේ සමාලෝචනය	02
2.	සාමාන්‍යාධිකාරීතුමන්ගේ පණිවිඩය	03
3.	සංස්ථාපිත තොරතුරු	04
	හැඳින්වීම	05
	4.1 සමාගම් ව්‍යුහය	05
	4.2 නිෂ්පාදන වැඩබිම් සම්බන්ධ විස්තර	06
	4.3 නිෂ්පාදන තොරතුරු	07
	4.4 අලෙවිය	07
5.	සංවර්ධනය කිරීම සඳහා දැනට පවතින ප්‍රධාන ක්ෂේත්‍ර	07
	5.1 මෙම සංවර්ධන කටයුතුවල සැළකිය යුතු ප්‍රතිදානය	08
6.	මූල්‍ය සාරාංශය	09
7.	ප්‍රධාන මාණ්ඩලික නිළධාරීන්ගේ විස්තර	10
8.	සංවිධාන ව්‍යුහය	11
9.	අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව	12-13
10.	කොටස් හිමිවරුන් වෙත ස්වාධීන විගණක වාර්තාව	14-21
11.	විගණනය කරන ලද ගිණුම් 2021/2022	22-65

1. සභාපතිතුමාගේ සමාලෝචනය

ජාතික ලුණු සමාගමේ වර්තමාන සභාපති වශයෙන් මම, 2021/2022 වර්ෂය සඳහා සමාගමේ වාර්ෂික ගිණුම් පිළිබඳ මාගේ සමාලෝචනය මෙයින් ඉදිරිපත් කරමි. සමාගමේ 2021/2022 වාර්ෂික මහා සභා රැස්වීමට ඔබව සාදරයෙන් පිළිගැනීමට ලැබීම ගැන ද, වාර්ෂික වාර්තාව සහ 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන ගිණුම් ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම ගැන ද මම සතුටට පත් වෙමි.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ජාතික ලුණු සමාගම රු. 249,051,040.00 ක පිරිවැටුමක් සාක්ෂාත් කරගෙන ඇති අතර, බදු ගෙවීමට පෙර ලාභය වශයෙන් රු. 130,991,933.00 ක් උත්පාදනය කර ගෙන ඇත. ආරම්භයේ සිටම අපගේ කාර්ය සාධනය දෙස ආපසු හැරී බලන විට අපගේ කාර්ය සාධනය පිළිබඳව අපට සාධාරණීකරණය කළ හැකිවාක් මෙන්ම ආඩම්බර විය හැකිය. 2021/2022 වර්ෂය තුළ නිශ්පාදන සහ වෙළඳාම් කටයුතු වල විශිෂ්ට ප්‍රගතියක් පෙන්වන අතර, සාමාගම විසින් රජයේ බදු වශයෙන් සමාගම රු. 21,051,885.00 ක මුදලක් ගෙවා ඇත.

ශ්‍රී ලංකාවේ ලුණු කර්මාන්තය සක්‍රීය ලෙස සංවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම සඳහා පහසුකම් සපයන්නා ලෙස කටයුතු කිරීමට සමාගමට හැකි වූ බව කොටස් හිමියන්ට වෙත මම සතුටින් දන්වා සිටිමි. 2021/2022 වර්ෂය තුළ දී සාක්ෂාත් කර ගන්නා ලද ප්‍රතිඵලයන්ට අනුව, කොටසක ඉපැයුම රු. 366.46 ක් විය.

වර්ෂය සඳහා අනුමත කරන ලද මුළු සේවක සංඛ්‍යාව 167 ක් විය. 2022.03.31 දින වන විට සිටි ස්ථීර සේවක සංඛාව 62 කි. සෑම ස්ථරයකම සිටින සියළුම සේවකයින්ගේ පූර්ණ සහයෝගය අඛණ්ඩව අප වෙත ලැබෙන බව දන්වා සිටින්නේ සතුටිනි.

ජාතික ලුණු සමාගමේ අපේක්ෂිත අරමුණු සාර්ථකව ඉටු කර ගැනීම සඳහා නව ස්කන්ධ ප්‍රාග්ධනයක් යෙදවීම තුළින් එහි වර්තමාන ප්‍රාග්ධන පදනම ශක්තිමත් කිරීම අවශ්‍ය වේ.

මෙම සමාගමේ සභාපතිවරයා ලෙස, මේස ලුණු සෑදීම සඳහා අවශ්‍ය වන යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම මඟින් අගය එකතු කිරීමේ ක්‍රියාවලිය වැඩි කිරීමටත්, එමෙන්ම වෙළඳපොලේ අපගේ මේස ලුණු අලෙවිය වැඩි කිරීමටත්, එමඟින් විකුණුම් ආදායම වැඩි කර ගැනීමටත්, මම සැලසුම් කර ඇත්තෙමි. තවද අලිමංකඩ ලුණු ලේවාය සම්පූර්ණ ධාරිතාවයෙන් යුක්තතව ක්‍රියාත්මක වන පරිදි නවීකරණය කෙරෙන අතර, අපගේ කළමනාකාරීත්වය විසින් කුරිංචතිව් ලුණු ලේවාය සංවර්ධනය කිරීමටත් සහ පරන්තන් කෙමිකල් සමාගමට සැපයීම සහතික කිරීමටත් කටයුතු කරමින් සිටී.

.

කර්මාන්ත අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය, රාජ්‍ය අධිකාරීන් මෙන්ම ගනුදෙනුකරුවන් විසින් අප වෙත ලබා දෙන අඛණ්ඩ දිරිගැන්වීම් සහ සහයෝගය පිළිබඳව ද අපි සතුටට පත් වන්නෙමු.

මේ අනුව ජාතික ලුණු සමාගම අපට ඇති සියළුම අභියෝග කරුවන්ට මුහුණ දීමට සූදානම් එසේම අපගේ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවන් සම්බන්ධයෙන් කඩිනමින් හා ඵලදායී ලෙස ප්‍රතිචාර දක්වන වන අතර, එමඟින් ආයතනයේ අඛණ්ඩ සාර්ථකත්වය සහතික කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින මගේ සහයකයින්ට ද කළමනාකාරීත්වයට සහ කාර්ය මණ්ඩලයට ද, ඔවුන් මා වෙත දක්වන ලද සහයෝගය වෙන්වෙන් මාගේ අවංක ස්තුතිය පුද කර සිටිමි.

ඩී.ආර්. අනුර බණ්ඩාර
සභාපති

2. සාමාන්‍යාධිකාරීතුමන්ගේ පණිවිඩය

ජාතික ලුණු සමාගම විසින් 2021 අප්‍රේල් 01 දින සිට 2022 මාර්තු 31 දින දක්වා කාලය තුළ දී සිය ක්‍රියාකාරකම්, කාර්යයන් අඛණ්ඩව සිදුකරගෙන යාම සහ ලාභ උපයා ගැනීම සම්බන්ධ වාර්ෂික මහා සභා රැස්වීමේදී මගේ පණිවිඩය ඉදිරිපත් කිරීමට ලැබීම මා ලද මහඟු අවස්ථාවකි.

පවත්නා මූල්‍ය වර්ෂයේදී මන්නාරම ලුණු ලේවාය සහ අලි මංකඩ ලුණු ලේවාය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකි විය. 2015 ජනවාරි මස 15 වන දිනැති අංක 1897/15 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුව, 2015 පෙබරවාරි මස සිට අලිමංකඩ ලුණු ලේවායේ පරිපාලන කටයුතු නැවතත් ජාතික ලුණු සමාගම යටතට පත්කර ඇත. මහා භාණ්ඩාගාරයේ මූල්‍ය සහයෝගය ඇතිව සිදුකෙරෙන එහි ප්‍රතිසංස්කරණ කටයුතුවලින් 90% ක් අවසන් කර ඇත.

2021/2022 වර්ෂය සඳහා අයවැය ගත ප්‍රමාණය වූ මෙ.ටො. 5500 ට සාපේක්ෂව මෙම මූල්‍ය වර්ෂය තුළ දී මන්නාරම ලුණු ලේවායේ ලුණු මෙ. ටො. 2378 ක් නිශ්පාදනය කිරීමට අපගේ කණ්ඩායමට හැකි වූ අතර, අයවැය ගත ප්‍රමාණය වූ මෙ. ටො. 16,000 ට සාපේෂව 2021/2022 වර්ෂය සඳහා ලුණු මෙ. ටො. 5283 ක් අලි මංකඩ ලුණු ලේවායෙහි නිශ්පාදනය කිරීමට හැකි විය. කොවිඩ් 19 ව්‍යසනය සහ අහිතකර දේශගුණික තත්වය හේතුවෙන් නිශ්පාදන අනුපාතය පහළ බසින ලදී. අයවැය ගත ප්‍රමාණය වූ මෙ. ටො. 5500 ට එදිරිව මන්නාරම ලුණු ලේවායෙහි ලුණු මෙ.ටො. 3,805 ක් ද, අයවැය ගත ප්‍රමාණය වූ 16,000 ට එදිරිව අලි මංකඩ ලුනු ලේවායෙහි ලුණු මෙ. ටො. 10,507 ක් ද, කි. ග්‍රෑ. 01 පැකට් කරන් ලද සාමාණ්‍ය ලුණු සහ අයිඩින් මිශ්‍ර ලුණු සහ කාර්මික ලුණු සහ කැට ලුණු යන ආකාරයන්ට අලෙවි කරන ලද අතර, වර්ෂය සඳහා මුළු ශුද්ධ පිරිවැටුම රුපියල් මිලියන 249,051,040.00 කි. සකස් කරන ලද ගිණුම් අනුව මෙම වසර සඳහා බදු ගෙවීමට පෙර තථ්‍ය ලාභය රුපියල් 109,940,047.00 ක් වේ.

අපගේ සමාගම සාධාරණ මිලකට ලුණු විකිණීමෙන් පාරිභෝගිකයින්ට සේවා සැපයීම සිදු කරනවා පමණක් නොව, ආදායම් බදු ලෙස රුපියල් මිලියන 21.5 ක් රජයට ගෙවා ඇති අතර, තවද සාධාරණ ලාභාංශ ප්‍රමාණයක් භාණ්ඩාගාරයට ගෙවීම ද සිදු කරනු ලබන බව ඉතා ආඩම්බරයෙන් ප්‍රකාශ කර සිටිමි.

2024 වර්ෂය වන විට ශ්‍රී ලංකා වෙළඳපලින් 18% ක් සපයනු ලබන ප්‍රධානම ලුණු නිශ්පාදකයා බවට ජාතික ලුණු සමාගම පත් කිරීමට කළමනාකාරිත්වය අරමුණු කර ඇත.

මෙම මූල්‍ය වර්ෂය තුළ දී සේවය කරන ලද කාර්ය මණ්ඩලය, අපේක්ෂිත ඉලක්ක සඳහා පුහුණු කිරීම, ඇගයීම, මූලික පහසුකම් සඳහා ප්‍රතිපාදන සැපයීම, ප්‍රසාද දීමනා ගෙවීම, යනාදී විවිධාකාරයේ වූ ක්‍රියාකාරකම් මඟින් බල ගන්වා ඇත.

අවසාන වශයෙන් මෙම සමාගමේ සාර්ථකත්වය සඳහා සිය හෘදයාංගම දායකත්වයක් ලබා දීම වෙනුවෙන් මම, කර්මාන්ත අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමන්ට සහ ලේකම්තුමාටත්, ආයතනයේ සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය සහ මාගේ කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තූතිය ප්‍රකාශ කර සිටිමි.

එම්. ජේ. තුවාන් මන්සිල්
සාමාන්‍යාධිකාරී

2. සංස්ථාපිත තොරතුරු

සමාගමේ නම	ජාතික ලුණු සමාගම. (රජය සතු සමාගමකි)
රේඛීය අමාත්‍යාංශය	කර්මාන්ත අමාත්‍යාංශය
ප්‍රධාන කාර්යාලය	561/3, ඇල්විටිගල මාවතල කොළඹ 05,
මන්නාරම ලුණු ලේවාය	ග්‍රෑන්ඩ් බසාර්, මන්නාරම
අලි මංකඩ ලුණු ලේවාය	A9 මාර්ගය, අලි මංකඩ, කිළිනොච්චි
සමාගමේ ලියාපදිංචි අංකය.	[N(PBS)942] නව අංකය: PB 1078
කොටස් හිමිකරුවන්	මහා භාණ්ඩාගාරය
අධ්‍යක්ෂ මණ්ඩලය	1. එච්.ජී. විජේතුංග මහතා - සභාපති 2022.02.10 දින දක්වා සහ ඒ.පී. මොරගොඩ මහතා - සභාපති 2022.02.11 දින සිට 2. එල්.පී. වැවලගේ මහතා (-භාණ්ඩාගාරයේ නියෝජිත) 3. ඩබ්. පී. හපුආරච්චි මහතා 4. ශාන්ත කුමාර මහතා 5. එල්.කේ.ජේ. ප්‍රියංකර මහතා 6. ආචාර්ය එස්.එම්.ජේ. ධර්මකීර්ති මහතා 7. ආචාර්ය එම්.එච්.එන්. කරුණාසිරි මහතා
නිරීක්ෂක	එස්.ජේ. ගුණරත්න මිය - නිරීක්ෂක
අධ්‍යක්ෂ මණඩල ලේකම්	කෝපරේට් එෆයාර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
විගණක	රජයේ විගණකවරුන් ජාතික විගණන කාර්යාලය ශ්‍රී ලංකාව
බැංකුකරු	ලංකා බැංකුව.

3. හැඳින්වීම.

3.1 සමාගමේ විෂයය

ශ්‍රී ලංකාවේ ලුණු නිෂ්පාදනය සම්බන්ධයෙන් දීර්ඝ ඉතිහාසයක් ජාතික ලුණු සමාගම සතුව ඇත. එම ආයතනය සාමාන්‍ය ලුණු, අයඩින් මිශ්‍ර ලුණු, කැට ලුණු සහ කාර්මික ලුණු නිෂ්පාදනය කරනු ලබයි. එහි ප්‍රධාන නිෂ්පාදන බිම් මන්නාරම සහ අලිමංකඩ (කිලිනොච්චි දිස්ත්‍රික්කය) යන ප්‍රදේශවල පිහිටා ඇති අතර, එහි පරිපාලන කාර්යාලය කොළඹ පිහිටා ඇත.

ලුණු දෙපාර්තමේන්තුව 1938 වර්ෂයේ දී ආරම්භ කර ඇති අතර, විවිධ වූ පරිපාලන අධිකාරීන් යටතේ පැවති එය අවසානයේ දී 2001 වර්ෂයේ සිට මාන්තායි සෝල්ට් ලිමිටඩ් ලෙස නම් කරන ලදී. 2021 වර්ෂයේ ජුනි මාසයේ දී මෙම ආයතනය, ජාතික ලුණු සමාගම ලෙස නැවත නම් කරන ලද අතර, වර්තමානයේ එය කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වේ. මෙම සමාගම විසින් නිෂ්පාදනය කරනු ලබන ලුණු දිවයිනේ අනෙකුත් ප්‍රදේශවලින් නෙලාගන්නා ලුණු හා සැසඳීමේ දී ගුණාත්මක බවින් ඉතාම ඉහල අගයක ඇති බව පිළිගැනේ. (එහි 96% ක් සෝඩියම් ක්ලෝරයිඩ් වේ) . දැනට මන්නාරම ලුණු ලේවාය මඟින් වසරකට පිරිසිදු නොකළ ලුණු මෙට්‍රික් ටොන් 6,000 ක් ද, එලිෆන්ටපාස් හි ලුණු මෙට්‍රික් ටොන් 17,000 ක් ද නිෂ්පාදනය කිරීමේ හැකියාව ඇත.


ජතික ලුණු සමාගම ස්වාභාවික සම්පත් උපයෝගීතා මධ්‍යස්ථානයක් ලෙස පමණක් නොව, මන්නාරම සහ කිලිනොච්චි දිස්ත්‍රික්කයන් හි අවදානමට ලක් වූ (පීඩිත) ජනතාවන්ට රැකියා අවස්ථාවන් ද ලබා දෙන මධ්‍යස්ථානයක් ලෙස ද ක්‍රියාත්මක වේ. අද වන විට 62 දෙනෙකුගෙන් සමන්විත වන ස්ථීර කාර්ය මණ්ඩලයක් ද 10 දෙනෙකුගෙන් සමන්විත කොන්ත්‍රාත් / අනියම් සේවක පිරිසක් ද සිටින අතර, දළ වශයෙන් පුද්ගලයින් 160 දෙනෙකුගෙන් සමන්විත වන තාවකාලික කාර්ය මණ්ඩලයක් ආයතනය විසින් සේවයේ යොදවා ඇත.

ජතික ලුණු සමාගම, මහා භාණ්ඩාගාරයේ සහ අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල සාමාජිකයින්ගෙන් සැදුම්ලත් මණ්ඩලය විසින් පාලනය වන අතර, එය කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථය යටතට අයත් වේ. සමාගමේ සංවර්ධන, නෛතික සහ වගකිවයුතු කාර්යයන් සම්බන්ධ අධීක්ෂණ කටයුතු සහ පහසුකම් සැපයීමේ කටයුතු අමාත්‍යාංශයේ ආයතනික අංශය විසින් සිදු කරනු ලබයි. එය රාජ්‍ය ව්‍යාපාරයක් වන බැවින් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සීමාසහිත සමාගමක් ලෙස සමාගම් නීති රීති වලට අනුකූලව ලියාපදිංචි කර ඇත. මේ අතර සමාගමේ නිෂ්පාදනයන් හී ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා මෙම ආයතනය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් සහතික කරනු ලැබේ. එසේම සමාගම ජාතික විගණන කාර්යාලය විසින් විගණනය කරනු ලැබේ.

සමාගමේ ඉතිහාස තොරතුරු

වර්ෂය		ආයතනයේ නම
සිට	දක්වා	
1938	1965	ලුණු දෙපාර්තමේන්තුව
1966	1990	ශ්‍රී ලංකා ජාතික ලුණු සංස්ථාව
1991	1996	ලංකා සෝල්ට් ලිමිටඩ්.
1997	Sept./2001	මන්නාරම දිසාපති යටතේ මන්නාරම ලුණු ලේවාය
ඔක්:./2001	ජුනි 2021	මාන්තායි සෝල්ට් ලිමිටඩ් (උතුරු පළාතේ පිහිටි ලුණු ලේවායන්)
ජුනි 2021	මේ දක්වා	ජතික ලුණු සමාගම (උතුරු පළාතේ පිහිටි ලුණු ලේවායන්)

දැක්ම



ව්‍යාපාරයේ ස්වභාවය අනුව සමාගම පහත පරිදි දැක්මකින් යුක්ත ය.

"රසායනික හා වෙනත් ක්‍රියාවලීන් හා සම්බන්ධ ස්වාභාවික සම්පත් ගවේෂණය කිරීමෙන් උතුරු පළාතේ ලුණු ආශ්‍රිත ව්‍යවසායන් සංවර්ධනය කිරීම සහ එමඟින් ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම".

මෙහෙවර

සමාගමේ මෙහෙවර පහත පරදි වේ .

"ලුණු ලේවායන් ක්‍රියාකාරීව පවත්වාගෙන යාම , ලුණු නිෂ්පාදනය, අගය එකතු කිරීම සහ ලුණු සහ අතුරු නිෂ්පා දන අලෙවි කරණය"

4.2 නිෂ්පාදන වැඩ බිම් සම්බන්ධ විස්තර

අ) මන්නාරම ලුණු ලේවාය

මන්නාරම ලුණු ලේවායේ සම්පූර්ණ නිෂ්පාදන භූමි ප්‍රමාණය අක්කර 163 කි. වාර්ෂික ලුණු නිෂ්පාදනය ආසන්න වශයෙන් මෙ.ටො. 6000 ක් වන අතර එය ශ්‍රී ලංකාවේ මුළු ලුණු නිෂ්පාදනයෙන් 3.3% ක් වේ. ලාභ ඉපැයීමේ ආයතනයක් ලෙස මෙම ආයතනය තම ලාභය මඟින් සිය කාර්ය මණ්ඩල වැටුප් ගෙවීම හා සුභ සාධන කටයුතු සමඟ ම ආයතනයේ යම් සංවර්ධන හා නඩත්තු කටයුතු සිදු කරයි.

ආ) අලිමංකඩ ලුණු ලේවාය

අලිමංකඩ ලුණු ලේවායේ සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වන නිෂ්පාදන භූමි ප්‍රමාණය අක්කර 750 වන අතර, නිශ්පාදන ධාරිතාව සාමාන්‍යයෙන් වසරකට මෙ.ටො. 25,000 කි.

මෙම ලුණු ලේවායේ නවීකරණ කටයුතුවලින් 90% ක් දක්වා සාර්ථකව නවීකරණය කර ඇති අතර, 2016 වසරේ සිට නිශ්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන ලද අතර 2019/20 වන විට මෙ.ටො.16,089ක නිශ්පාදනයක් සාක්ෂාත් කරගෙන ඇත.

වර්තමානයේ මෙම ලුණු ලේවායන් දෙකෙහිම සාමාන්‍ය ලුණු නිශ්පාදන කරන අතර, නුදුරු අනාගතයේ දීම මේස ලුණු යන්ත්‍රාගාර ස්ථාපිත කිරීම මඟින් අගය එකතු කිරීමේ ක්‍රියාවලියක් මහා පරිමාණයෙන් සිදු කිරීමට සැලසුම් කරමින් පවතී.

4.3 නිශ්පාදන විස්තර

ලුණු ලේවාය	2017/2018	2018/2019	2019/2020	2020/2021	2021/2022
මන්නාරම	6284	6249	6683	2,786	2378
අලි මංකඩ	7130	10314	16089	8,496	5283
එකතුව	**13414**	**16,563**	**22772**	**11,282**	**7661**

4.4 අලෙවිය

වර්ෂය	අලෙවිය (මෙ.ටො.)	ආදායම් (මිලි) රු.
2015/2016	5063	62.3
2016/2017	3337	93.8
2017/2018	6094	83.7
2018/2019	16,146	155.38
2019/2020	13,063	103.47
2020/2021	23,484	201.56
2021/2022	14312	249.05

5. යෝජිත අනාගත සංවර්ධන සැලැස්ම

අ) මන්නාරම ලුණු ලේවාය

1) සමාගම විසින් පැයට මෙ.ටොන් 02 ක් නිපදවන ස්ථටික ලුණු යන්ත්‍රාගාරයක් සාර්ථකව ස්ථාපනය කර ඇත. මේ වන විට ඇසුරුම් කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර, දිස්ත්‍රික්කය තුළ සිටින බෙදාහරින්නන් සහ තොග ගැණුම් කරුවන් මගින් විකිණීම සිදු කරනු ලබයි.

සමාගම, වසරකට මෙට්‍රික් ටොන් 3000ක් සඳහා ස්ඵටික ලුණු පැකට් කිරීමේ ක්‍රියාවලිය පුළුල් කිරීමේ කටයුතුවල නිරතව සිටින අතර, ඒ අනුව අලෙවිකරණ සහ විකුණුම් ඒකකයන් සංවර්ධනය කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

තවද, මේස ලුණු යන්ත්‍රාගාරයක කොටසක් සවි කිරීම මඟින් යන්ත්‍රාගාරය වැඩිදියුණු කර මේස ලුණු නිෂ්පාදනය කිරීමට සැලසුම් කර ඇත.

2) මන්නාරම ලුණු ලේවායේ පරිපාලන කටයුතු සඳහා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට නියමිතය.

3) මන්නාරම ලුණු ලේවාය සඳහා ක්ෂේත්‍ර කාර්යාලය ඉදිකිරීමට නියමිතය.

<u>ආ) අලි මංකඩ ලුණු ලේවාය</u>

1. අක්කර 750 ක භූමි ප්‍රදේශයක නිශ්පාදන කටයුතු ආරම්භ කිරීම සඳහා පූර්ණ ධාරිතාවයෙන් යුතු ලුණු ලේවාය පුනරුත්තාපනය කිරීම.
2. පැයකට මෙ.ටොන් 05ක ධාරිතාවයෙන් යුත් මේස ලුණු කම්හලක් ස්ථාපනය කිරීමට කටයුතු කරමින් පවතී..

5.1 මෙම සංවර්ධන කටයුතුවල සැළකිය යුතු ප්‍රතිදානය.

• නව යන්ත්‍රාගාර මඟින් නිපදවන ස්ඵටික ලුණු නිශ්පාදනය සහ අලෙවිය, වෙළඳපළ ව්‍යාප්ත කිරීමට සහ පුළුල් කිරීමට උපකාරී වන අතර, එමඟින් වෙළඳපල තුළ සමාගමේ ශක්‍යතාව සහතික කෙරේ.

• අලෙවිය වැඩි කිරීම සහ කඩිනම් කිරීම මඟින් තොග ගබඩා කිරීමේ සහ රඳවා තබා ගැනීමේ කාල සීමාවන් අඩු කිරීමට හැකි වේ.

• අවශ්‍යතා පුළුල් කිරීම මත රැකියා අවස්ථා නිර්මාණය කෙරේ.

• වැඩිවන ලාභය මඟින් සේවකයින්ට වැඩි සුභසාධන පහසුකම් සහ ප්‍රතිලාභ ලබා දීමට මූලික වේ.

• ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නිර්ණායක සපුරාලන අතර ගුණාත්මකභාවය පවත්වාගෙන යනු ලැබේ.

• ග්‍රාමීය වෙළඳපොලේ නිෂ්පාදන සාධාරණ මිලකට ලබා දීම මඟින් අයඩින් ඌනතා ගැටලුව තුරන් කිරීම සඳහා නිෂ්පාදන හා සිල්ලර වෙළඳාම දායක වේ.

• සැලකිය යුතු ලාභාංශ භාණ්ඩාගාරයට ගෙවනු ලබන අතර, මහජනතාවට අවසාන ප්‍රතිලාභය ලබා දෙනු ලබන ජාතික සංවර්ධනය සඳහා වන එකතු කළ අගය මත බදු (වැට්) හා ජාතිය ගොඩ නැගීමේ බදු වැනි බදු රජයට ලැබෙනු ඇත.


6. මූල්‍ය සාරාංශය

මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	ඒකක	2021/2022	2020/2021	2019/2020	2018/2019	**2017/2018**
නිෂ්පාදනය	මෙ.ටො	7,661	11,283	22,772	16,563	13,414
අලෙවිය	මෙ.ටො	14,312	23,484	13,063	16,146	6,094
ආදායම	රු.	249,051,040	201,568,231	103,473,982	155,380,640	83,796,285
දළ ලාභය	රු.	132,998,887	72,039,111	19,170,216	47,041,469	36,053,276
ශුද්ධ ලාභය	රු.	109,940,047	60,170,921	12,796,333	35,176,712	27,789,256
ශුද්ධ වත්කම්						
ජංගම නොවන මුළු වත්කම්	රු.	132,385,413	276,402,270	149,768,539	198,751,368	160,315,681
මුළු ජංගම වත්කම්	රු.	306,829,638	74,059,721	146,737,592	103,592,678	115,702,454
අඩු කළා ජංගම නොවන වගකීම්	රු.	(11,901,537)	(10,003,783)	(9,296,086)	(11,387,535)	(10,433,573)
අඩු කළා ජංගම වගකීම්	රු.	(27,177,932)	(18,712,426)	(12,657,428)	(19,574,079)	(24,752,393)
		400,135,582	**321,745,782**	**274,552,617**	**271,382,432**	**240,832,169**
කොටස් හිමියන්ගේ අරමුදල්						
නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය	රු.	30,000,000	30,000,000	30,000,000	30,000,000	30,000,000
	රු.					
සංචිත		370,135,582	291,745,782	244,552,617	241,382,432	210,832,169
		400,135,582	**321,745,782**	**274,552,617**	**271,382,432**	**240,832,169**
රජයට ආදායම						
ආදාම් බදු	රු.	21,051,885	9,997,609	498,090	6,559,465	5,237,520
කොටසක ඉපැයුම	රු.	366.46	**200.56**	**42.65**	**117.25**	**92.63**

7. ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන් පිළිබඳ විස්තර

නම	තනතුර	සුදුසුකම්	මාන්තායි සොල්ට් ලිමිටඩ් හි සේවා කාලය
එම්.ජේ. තුවාන් මන්සිල් මහතා	සාමාන්‍යාධිකාරී	BSc. MBA, Dip in HRM, Dip in Eng. AAT-1	2014 සැප්තැම්බර් මස සිට
ආර්.වී. විනෝහරන් මහතා	මූල්‍ය කළමනාකරු	ACMA	2017 ජනවාරි මස සිට
ඒ.කිෂෝතරන් මහතා	කළමනාකරු- ලුණු ලේවාය	B.Sc /PGD	2008 අප්‍රේල් මස සිට
ඩී.ජේ.එච්.එස්. පුෂ්පකුමාර මහතා	සහකාර මූල්‍ය කළමනාකරු	CASL (Inter)	2019 පෙබරවාරි මස සිට
එම්.එෆ්. ෆහිසාල් මහතා	සහකාර කළමනාකරු -ලුණු ලේවාය	Dip in Mec Eng.	2010 නොවැම්බර් මස සිට
එස්.ජේ. ජිනදාස මිය	අභ්‍යන්තර විගණන නිලධාරී	AAT satge 1& 2 & Dip in HR	20 12අප්‍රේල් මස සිට
ඊ. විජයාන් මයා	සහකාර කළමනාකරු- ලුණු ලේවාය	G.C.E. Advance level	2002 අප්‍රේල් මස සිට

8. සංවිධාන ව්‍යුහය


සභාපති
අධ්‍යක්ෂ මණ්ඩලය
සාමාන්‍යාධිකාරි
HM 1-3
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි -01
HM 1-1
මූල්‍ය කළමනාකරු - 01
MM 1-1
පිරිවැය ගිණුම් කළමනාකරු -1
MM-1
අලෙවි කළමනාකරු
MM 1-1
කළමනාකරු ලුණු ලේවාය
02
MM 1-1
පරිපාලන කළමනාකරු
01
MM 1-1
අභ්‍යන්තර විගණක MM1-1 - 01
ස. මූල්‍ය කළමනාකරු -01
JM1-1
ස. අලෙවි කළමනාකරු
01
ස. ත. පාලන කළමනාකරු ලුණු ලේවාය
01
ස. කළමනාකරු ලුණු ලේවාය
-05
ස. පරිපාලන කළමනාකරු - 01
JM1-1
අභ්‍යන්තර විගණන නිලධාරී -01
JM1-1
තාක්ෂණ නිලධාරී 01
MA2-1
ලුණු ලේවා නිලධාරී (07)
MA 2-1
ගබඩා භාරකරු
(03)
MA2-1
කළමනාකරණ සහකාර (07)
MA 1-1
කළමනාකරණ සහකාර (04) MA 1-1
ආරක්ෂක ස්ථානභාර නිලධාරී (02) MA 1-2
කළමනාකරණ සහකාර (7)
MA 1-1
කළමනාකරණ සහකාර (01)
MA 1-1
ප්‍රාථමික මට්ටම අඩ පුහුණු
(14)
ස. කාර්මික ශිල්පී -03
ස. ගබඩා පාලක 03
පොම්ප ක්‍රියාකරු - 08
PL-2
ප්‍රාථමික මට්ටම පුහුණු
(23)
රියදුරු 06
කාර්මික ශිල්පී -2
විදුලි කා. ශිල්පී -3
අධික්ෂක - 8
තාක්ෂණ ශිල්පී 2
((විද්‍යාගාර සහ වාරිමාර්ග)
කාර්මික ශිල්පී - 2
(සිවිල්)
PL-3
රියදුරු (04)
PL-3
ප්‍රාථමික මට්ටම නුපුහුණු
(75)
කාර්යාල සහයක - 6
කම්කරු -61
ආරක්ෂක -08
PL-1

9. <u>අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව.</u>

සමාගමේ අධ්‍යක්ෂවරු විසින්, 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද ශේෂ පත්‍රය සහ ආදායම් ප්‍රකාශණය සමඟ ඔවුන්ගේ වාර්තාව ද මේ සමඟ ඉදිරිපත් කරති.

<u>ප්‍රධාන ක්‍රියාකාරකම්</u>

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ ලුණු නිෂ්පාදනය හා අලෙවියයි.

<u>මූල්‍ය සාරාංශය</u>

2022 මාර්තු ම 31 වන දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය

	රු.
ලුණු අලෙවිය	249,051,040
මුළු පිරිවැටුම	249,051,040
විකුණුම් පිරිවැය	116,052,153
දළ ලාභය	132,998,887
කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ ලාභය (බදු ගෙවීමෙන් පසු)	**109,940,047**
කොටසක ඉපැයීම් ලාභය	**366.46**

<u>අධ්‍යක්ෂවරු.</u>

2021/22.වර්ෂය තුල දී සමාගමේ අධ්‍යක්ෂවරුන් ලෙස ක්‍රියා කළ නිලධාරීන් පහත දැක්වේ

1. එච්.ජී. විජේතුංග මහතා - සභාපති 2022.02.10 දින දක්වා
   සහ
   ඒ.පී. මොරගොඩ මහතා - සභාපති 2022.02.11 දින සිට

2. එල්.පී. වැවලගේ මහතා (-භාණ්ඩාගාරයේ නියෝජිත)

3. ඩබ්. පී. හපුආරච්චි මහතා

4. එල්.කේ. ජේ. ප්‍රියංකර මහතා

5. ආචාර්ය එස්.එම්.ජේ. ධර්මකීර්ති මහතා

6. ආචාර්ය එම්.එච්.එන්. කරුණාසිරි

7. ශාන්ත කුමාර මහතා

<u>අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමි කාරිත්වය</u>

අධ්‍යක්ෂවරුන් සමාගමේ එකම කොටසකටවත් හිමිකම් නොපායි.

<u>කොන්ත්‍රාත්තුවලින් අධ්‍යක්ෂවරුන්ට ඇති සම්බන්ධය.</u>

සමාගම සමඟ ඇති කිසිදු කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ට සෘජු හෝ වක්‍ර සම්බන්ධතාවයක් නොමැත.

<u>විගණකවරු</u>

සමාගමේ වර්තමාන විගණක වරයා වන්නේ ශ්‍රී ලංකාවේ ජාතික විගණන කාර්යාලය යි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි

සමාගමේ ලේකම්

විගණනය කරන ලද ගිණුම්
2021/2022

සභාපති

ජාතික ලුණු සමාගම

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන පරිච්ඡේදය ප්‍රකාරව 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ජාතික ලුණු සමාගමේ මූල්‍ය ප්‍රකාශණ සහ අනෙකුත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශණ

1.1 තත්වාගණනය කල මතය

ජාතික ලුණු සමාගමේ ("සමාගමහි") 2022 මාර්තු 31 දිනට අදාල වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශය

2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සහ විස්තීරණ ආදායම් ප්‍රකාශය, කොටස් වල වෙනස්වීම් ප්‍රකාශය සහ වර්ෂය අවසන් වන විට මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශයක් ඇතුළු මූල්‍ය ප්‍රකාශණ සඳහා වන සටහන් වලින් සමන්විත වන 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධානවලට සමගාමීව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වගන්තියේ ප්‍රතිපාදන අනුව මාගේ මහ පෙන්වීම යටතේ සිදු කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව මා සැකසූ වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ඇත.

මාගේ වාර්තාවේ තත්වාගණනය කල මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර සමාගමේ 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථීත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයන් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්වාගණනය කල මතය සඳහා පදනම

අ) කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථීත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හී (SLFRS for SMEs) වාර්තා කිරීමේ කාලසීමාව අවසන් වීමෙන් පසු සිදුවන සිදුවීම් හා සම්බන්ධ 32.2 පරිච්ඡේදයට පටහැනිව, මන්නාරමේ බදු දුන් ඉඩමක් සම්බන්ධයෙන් 2013 වර්ෂයේ සිට රු. 6,115,200ක බදු කුලී වටිනාකම සමාගම විසින් සපයා නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේ ලාභය

රු.524,160 කින් ද සහ රඳවා ගත් ඉපයීම් රු. 5,197,920කින් ද වැඩියෙන් දක්වා තිබුණි. තවද වගකීම එම ප්‍රමාණයෙන්ම අඩුවෙන් දක්වා තිබුණි.

ආ) කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථීත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හී දේපොළ, යන්ත්‍ර සහ උපකරණ සම්බන්ධයෙන් වන 17.2 පරිච්ඡේදයේ දැක්වෙන කරුණුවලට අනුකූලව දේපොළ, යන්ත්‍ර සහ උපකරණ සම්බන්ධ විස්තර ස්ථාවර වත්කම් සත්‍යාපන වාර්තාවේ ඇතුලත් කර තිබුන ද, අලිමංකඩ ලුණු ලේවායේ භාවිතා කරන රු. 6,828,395 ක් වටිනා වාහන සහ උපකරණ පිළිබඳව සැළකිල්ලට ගෙන නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස දේපොළ, යන්ත්‍ර සහ උපකරණ සම්බන්ධයෙන් රු. 6,828,395 ක් අඩුවෙන් දක්වා තිබූ අතර, රු. 682,839 ක් ක්ෂය කර තිබුණි.

ඇ) කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථීත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හී දේපොළ, යන්ත්‍ර සහ උපකරණ සම්බන්ධයෙන් වන 17.21 පරිච්ඡේදයේ දැක්වෙන කරුණුවලට පටහැනිව, සමාගම විසින් ගොඩනැගිලි හැර සියළුම දේපොළ, යන්ත්‍ර සහ උපකරණ සඳහා 10% ක ක්ෂය අනුපාතය භවිතා කර තිබුණි.

ඈ) කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථීත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හී දේපොළ, යන්ත්‍ර සහ උපකරණ සම්බන්ධයෙන් වන 17.19 පරිච්ඡේදයට අනුව, වසර අවසානයේ දී ඇස්තමේන්තු ගත වත්කම්වල ආයු කාලය සමාලෝචනය කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාගම විසින් භාවිතා කරමින් තිබූ රුපියල් 4,854,285 ක උපකරණ සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ බව නිරීක්ෂණය විය.

ඉ) කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථීත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හී වට්ටෝරු පොත් (ඉන්වෙන්ට්‍රී) හා සම්බන්ධ 13.8 පරිච්ඡේදයට පටහැනිව, සමාගම විසින් ක්‍රමක්ෂය එකතුව වන රු. 8,150,247 ක මුදල හැර නිශ්පාදන පිරිවැයට අදාලව අවසන් තොගය ගණනය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස අලිමංකඩ ලුණු ලේවාය සම්බන්ධ අවසන් තොගයේ රු.1,1 84,730 ක වෙනසක් ඇති වී ඇත.

ඊ) කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථීත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හී ගිණුම්කරණ ප්‍රතිපත්ති, ඇස්තමේන්තු සහ දෝෂ හා සම්බන්ධ 10.21 පරිච්ඡේදයට අනුව, අතීතයට බලපාන පරිදි දෝෂ ගැලපිය යුතුය. කෙසේ වෙතත් සමාගම විසින් මන්නාරම සහ අලිමංකඩ ලුණු ලේවායන් හී ඇති ගොඩනැගිලි සම්බන්ධ ක්ෂය වශයෙන් 5% ක් ලෙස ගණනය කිරීම වෙනුවට 10% ක් ලෙස ගෙන දෝෂ ගලපා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස වත්කම් සහ රඳවාගත් ඉපයීම් රු. 1,489,486 කින් අඩුවෙන් සටහන් වී ඇත.,

උ) ස්ථීවර වත්කම් සත්‍යාපන වාර්තාවට අනුව මන්නාරම ලුණු ලේවායේ ස්ථාවර වත්කම් රු.40,318,411 ක් ලෙස පෙන්වා තිබූ අතර, මූල්‍ය ප්‍රකාශණයේ එය රු. 38,555,395 ක් ලෙස පෙන්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ස්ථීවර වත්කම් සත්‍යාපන වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශණය අතර රු. 1,763,016 ක වෙනසක් දක්නට ඇත.

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට (SLAuSs) අනුව සිදු කරන ලදී. එකී ප්‍රමිතීන්ට අනුව, මාගේ වගකීම්, මාගේ වාර්තාවේ ‘‘මූල්‍ය ප්‍රකාශණ විගණණය සඳහා වන විගණකගේ වගකීම්’’ යන

ඡේදයේ ද තවදුරටත් විස්තර කර ඇත. මාගේ විගණන මතයට පදනමක් සැපයීම සඳහා මා විසින් ලබාගන්නා ලද විගණන සාක්ෂි, ප්‍රමාණවත් සහ සුදුසු යැයි මම විශ්වාස කරමි.

1.3 <u>සමාගමේ 2021/2022 වර්ෂයේ වාර්ෂික වාර්ථාවේ ඇතුලත් අනෙකුත් තොරතුරු.</u>

අනෙකුත් තොරතුරු, සමාගමේ 2021/2022 වාර්ෂික වාර්තාවේ ඇතුලත් කොරතුරු වලින් සමන්විත වන නමුත්, මෙම විගණන වාර්තාවේ දිනට පසුව මා වෙත සැපයීමට අපේක්ෂිත මූල්‍ය ප්‍රකාශණ සහ එ පිළිබඳ මාගේ විගණන වාර්තාව ඇතුලත් නොවේ. අනෙකුත් තොරතුරු සම්බන්ධෆයන් කළමණාකාරීත්වය වගකිව යුතු වේ.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳව කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාලව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට ඒවා අධ්‍යයනය කිරීම සහ, එසේ කිරීමේදී, අනෙකුත් තොරතුරු, මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම සමඟ ප්‍රමාණාත්මකව නොගැලපේද යන්න සලකා බැලීමයි.

මා විසින් සමාගමේ 2021/2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අධ්‍යයනය කිරීමේ දී එහි වැදගත් අවප්‍රකාශණයන් ඇති බවට මා විසින් නිගමනය කරන්නේ නම්, ඒවා නිවැරදි කිරීම සඳහා පරිපාලනයට සම්බන්ධ අය වෙත එම කාරණය දැනුම් දීමක් කිරීමට මට අවශ්‍ය වේ. තවදුරටත් නිවැරදි නොකළ වැදගත් අවප්‍රකාශ තිබේ නම් ඒවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියේ විධිවිධාන අනුව, යථා කාලයේ දී මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකාර මණ්ඩලයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්.</u>

කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන අයුරින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ වැරදි හෝ වංචා හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර මූල්‍ය ප්‍රකාශණ සකස් කිරීමට අවශ්‍යයැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනයක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කළමනාකාරීත්වය වගකීම දරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී , සමාගම ඇවර කිරීමට හෝ මෙහෙයුම් නතර කිරීමට හෝ එසේ කිරීම හැර වෙනත් යථාර්ථවාදී විකල්පයක් නොමැති බව කළමණාකාරීත්වය අදහස් නොකරන්නේ නම්, ආයතනය අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙන යාමට සමාගම සතු හැකියාව තක්සේරු කිරීම,

අඛණ්ඩව පවත්වාගෙන යාම හා සම්බන්ධ උපයෝගී කරුණු අනාවරණය කිරීම සහ ගිණුම් කරණයේ අඛණ්ඩ පදනම භාවිතා කිරීම සම්බන්ධයෙන් කළමනාකාරිත්වය විසින් වගකිව යුතුය.

පාලන කාර්යය පැවරී ඇති තැනැත්තන් සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම කෙරෙහි වගකිව යුතු වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය අනුව සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශණය පිළියෙල කිරීමට හැකිවන අයුරින්, සමාගම සිය සියළුම ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම් සම්බන්ධයෙන් නියමිත පොත් සහ වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

1.5 මූල්‍ය ප්‍රකාශණ විගණනය කිරීමේ දී විගණකගේ වගකීම.

වංචා සහ වැරදි හේතුවෙන්, සමස්තයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශණය වැදගත් අවප්‍රකාශනයන්ගෙන් තොර වන්නේ ද නැද්ද යන්න පිළිබඳව සාධාරණ සහතිකයක් ලබා ගැනීම සහ මාගේ උපදෙස් ඇතුලත් විගණන වාර්තා නියෝගයක් නිකුත් කිරීම මාගේ පරමාථයයි. සාධාරණ සහතිකයක් යනු ඉහළ මට්ටමේ සහතිකයක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරන ලද විගණනයක් සෑම විටම වැදගත් අවප්‍රකාශණ පවතින විට ඒවා අනාවරණය වන බවට සහතිකයක් නොවේ. අවප්‍රකාශණ, වංචා හෝ වැරැද්දකින් ඇතිවිය හැකි අතර, ඒවා තනි තනිව හෝ සමස්තයක් වශයෙන් ගත් කල, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන ගනු ලබන පරිශීලකයින්ගේ ආර්ථික තීරණවලට බලපෑම් කරනු ඇතැයි ඔවුන් සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකිය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරන විගණනයක කොටසක් ලෙස, මම වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කරන අතර විගණනය පුරාම වෘත්තීය සැකය පවත්වා ගනිමි. තවද මවිසින්,

- වංචා හෝ දෝෂ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල සිදුවන වැදගත් අවප්‍රකාශණයන්හී අවදානම හඳුනාගෙන ඒවා තක්සේරු කිරීම, එම අවදානම් වලට ප්‍රතිචාර දක්වන විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ මගේ මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම සිදු කරමි. වංචාවට, කුමන්ත්‍රණය, කූට ලේඛණ සැකසීම, හිතා මතා සිදු කරන පැහැරහැරීම්, අවනිදේශණ, හෝ අභ්‍යන්තර පාලනය ඉක්මවා යාම සම්බන්ධවන බැවින්, වංචාව නිසා ඇතිවන වැදගත් අවප්‍රකාශන හඳුනා නොගැනීමේ අවධානම වැරදි නිසා සිදුවන වැදගත් අවප්‍රකාශණ හඳුනා නොගැනීමේ අවධානමට වඩා වැඩි වේ.
- ඒ ඒ අවස්ථාවන්ට යෝග්‍ය වන පරිදි විගණන ක්‍රියා පටිපාටි සැළසුම් කිරීමේ අරමුණින් විගණනයට අදාල වන අභ්‍යන්තර පාලනය පිළිබඳව සැළකිල්ලට ගන්නා නමුත්, සමාගමේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීතාවය සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල යෝග්‍යතාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල මෙන්ම කළමනාකාරීත්වය විසින් කරන ලද අනාවරණය කිරීම්වල සාධාරණත්වය ඇගයීම ද,
- ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමට සමාගමට ඇති හැකියාව සම්බන්ධයෙන් සැළකියයුතු සැකයක් ඇති කරවන සිද්ධීන් සහ තත්වයන් හා සම්බන්ධ වැදගත් අවිනිශ්චිතතාවන් පවතින්නේ ද යන්න, ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම්ව සහ ගිණුම්කරණයේ අඛණ්ඩත්වය මත කළමනාකරණ භාවිතයන්ගේ යෝග්‍යතාවය නිශ්චය කිරීම ද, වැදගත් අවිනිශ්චිතතාවයන් පවතින්නේ යැයි මා නිශ්චය කරන්නේ නම්, මාගේ මතය වෙනස් කිරීමට එවැනි හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මූල්‍ය ප්‍රකාශණවල අදාල අනාවරණය කිරීම් සම්බන්ධයෙන් මාගේ විගණන වාර්තාව වෙත අවධානය යොමු කරවීම අවශ්‍ය වේ. මාගේ නිගමනය, මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා මා විසින් ලබා ගන්නා ලද විගණන සාකිෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්වයන් සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාම නතර කිරීම හේතු විය හැකිය.
- අනාවරණය කිරීම් ඇතුළුව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සහ මූල්‍ය ප්‍රකාශන සාධාරණ ඉදිරිපත් කිරීමක් ලබා ගන්නා අයුරින් ඉස්මතු කරන ලද ගනුදෙනු සහ සිදුවීම් නියෝජනය කරන්නේද යන්න තක්සේරු කිරීම ද කරනු ලැබේ.

අනෙකුත් කරුණු අතර, මාගේ විගණනයේදී මා හඳුනා ගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩු ද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් පාලන කාර්යය පැවරී ඇති තැනැත්තන් සමඟ මම අදහස් හුවමාරු කර ගනිමි.

2. <u>අනෙකුත් නෛතික සහ නියාමන අවශ්‍යතා සම්බන්ධ වාර්තාව</u>

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනත සහ 2007 අංක 07 දරණ සමාගම් පනත් හි පහත සඳහන් අවශ්‍යතා සඳහා නිශ්චිත විධිවිධාන ඇතුලත් වේ.

2.1.1 විගණන මතය සඳහා පදනම නම් වූ කරුණු පිළිබඳ පරිච්ඡේදයේ විස්තර කරන ලද කරුණුවල බලපෑම හැරුණු විට, විගණනයට අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගෙන ඇති අතර, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ 163 (2) වගන්තියේ අවශ්‍යතාවන්ට අනුකූලව සමාගම විසින් නිසි පරිදි ගිණුම් වාර්තා පවත්වාගෙන ගොස් ඇති බව තවදුරටත් මාගේ පරීක්ෂණවලින් විද්‍යාමාන වේ.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ නියමයට අනුව, ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශණ පෙර වර්ෂයට අනුකූල වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ නියමයට අනුව, ඉදිරිපත් කරණ ලද මූල්‍ය ප්‍රකාශණවල, විගණන මතය සඳහා පදනම නම් වූ කරුණු පිළිබඳ පරිච්ඡේදයේ 1.2 (f) හි විගණන කරුණු හැරුනු විට මා විසින් පෙර වර්ෂයේ කරන ලද සියළුම නිර්දේශයන් ඇතුලත් වේ.

2.2 අනුගමනය කරන ලද ක්‍රියා පටිපාටි සහ වැදගත් කරුණුවලට සීමා වී ලබා ගන්නා ලද සාක්ෂි මත පදනම් වූ කරුණු හැර ,

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ නියමයන්ට අනුව, සමාගම විසින් ඇතුලත්වන කිසිදු කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් සමාගමේ පාලන මණ්ඩලයේ කිසිදු සාමාජිකයෙකුට සාමාන්‍ය ව්‍යාපාර පටිපාටියෙන් බැහැරව,සෘජු හෝ වක්‍ර බැඳියාවක් තිබූ බවට සඳහන් කිරීමට කිසිවක්, හෝ,

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුව කිසිදු උපයෝගී ලිඛිත නීතියකට හෝ සමාගමේ පරිපාලන මණ්ඩලය විසින් නිකුත් කරන ලද සාමාන්‍ය සහ විශේෂ නියමයන් සමඟ අනුකූල නොවන බව සඳහන් කිරීමට කිසිවක් හෝ,

නීති, රීති සහ රෙගුලාසි සඳහා යොමුව	**අනුරූපතාව (ඉටු නොකිරීම)**
2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 6.6 පරිච්ඡේදය	මූල්‍ය වර්ෂය අවසන් වූ පසු දින 60ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශණ විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද සාමගම විසින් එකී වාර්තාව ඉදිරිපත් කර ඇත්තේ 2022 දෙසැම්බර් මස 21 වන දින දී වන අතර, ප්‍රමාදය මාස හයකට වඩා වැඩි වේ.

2.2.3 සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ස්ථාපිත කර ඇති අතර 2007 අංක 07 දරණ සමාගම් පනත අඛණ්ඩව පවත්වාගෙන එනු ලබයි. සමාගම 2001 ජූලි 31 දිනෙන් පසු එහි සමාගම් ව්‍යවස්ථාව සංශෝධනය කර නැත. සමාගම් ව්‍යවස්ථාවේ දැක්වෙන එහි මූලික අරමුණක් ඉටුකර ගැනීමට සමාගම අපොහොසත් වී ඇත, එනම් රසායනික ද්‍රව්‍ය සහ අභ්‍යන්තර සහ සාගර ජලයෙන් ලබාගන්නා නිෂ්පාදනයන් සහ ව්‍යුත්පන්න කරන්නා වූ ඕනෑම අතුරු නිෂ්පාදනයක් නිෂ්පාදනය කිරීම සහ විකිණීම. තවද, මුහුදු පැලෑටි, මුහුදු ආහාර සහ මුතු ආනයනය හා අපනයනය ඇතුළු කෘෂිකාර්මික හා ජලජීවී වගා ව්‍යාපාර කරගෙන යාම සඳහා වන සමාගමේ අනුයාත බලය සහ තවත් අනුයාත බලයක් වන පොලි ප්‍රොපිලීන් ඇසුරුම් නිශ්පාදනය සහ ඒවා ප්‍රවාහණය කිරීම ඇතුළු ඇසුරම් කටයුතු සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සහ ආනයනය කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට සමාගම අපොහොසත් වී තිබීම හැරුණු විට, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අංක 12 (උ) වගන්තියේ

අවශ්‍යතාවයන්ට අනුව, සමාගම විසින් එහි බලතල, කාර්යයන් සහ රාජකාරීවලට අනුකූල නොවන ලෙස කටයුතු කළ බවට සඳහන් කිරීමට කිසිවක්, හෝ

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ නියමයට අනුව, සම්පත් කාල රාමුව තුළ සහ අදාළ නීතිවලට අනුකූලව සකසුරුවම්ව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස සමාගමේ සම්පත් ප්‍රසම්පාදනය කර සහ ප්‍රයෝජනයට ගෙන නොමැති බවට සඳහන් කිරීමට කිසිවක් හෝ, හෝ මාගේ අවධානයට ලක් නොවී ය.

3. <u>අනෙකුත් කරුණු</u>

(a) 2017 වර්ෂයේ සිට රුපියල් 34,211 ක් වූ ණයගැති ශේෂය අයකර ගැනීමට සහ 2019 වර්ෂයේ සිට ගෙවීමට තිබූ රුපියල් 811,706 වන භාණ්ඩාගාර අරමුදල් ශේෂය පියවීමට සමාගම අපොහොසත් වී ඇත.

(b) සමාලෝචිත වර්ෂය සඳහා මන්නාරම සහ අලිමංකඩ ලුණු ලේවායන් හී නිශ්පාදනය මෙ.ටො.7,661 වූ අතර, එය අයවැය ගත නිශ්පාදනය වූ මෙ.ටොන් 13,839 න් 64% ක් පමණි.

ඩබ්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

ජාතික ලුණු සමාගම
2022 මාර්තු මස 31 දිනෙන් අවසන් වූ
වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශණ

ජාතික ලුණු සමාගම 2022 මාර්තු 31 වන
දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
විස්තීරණ ආදායම් වාර්තාව

	සටහන්	2022	2021
		රු.	රු.
ආදායම	(3)	249,051,040	201,568,231
විකුණුම් පිරිවැය		(116,052,153)	(129,529,120)
දල ලාභය		132,998,887	72,039,111
වෙනත් මෙහෙයුම් ආදායම්	(4)	16,196,273	16,635,817
		149,195,160	88,674,928
පරිපාලන වියදම්		(17,002,805)	(17,503,340)
බෙදාහැරීම හා විකුණුම් වියදම්		(913,567)	(972,613)
මෙහෙයුම් ලාභය	(5)	131,278,787	70,198,975
මූල්‍ය වියදම	(6)	(286,855)	(30,445)
බදු ගෙවීමට පෙර ලාභය	(7)	130,991,933	70,168,530
ආදායම් බදු		(21,051,885)	(9,997,609)
වර්ෂය සඳහා බදු ගෙවීමෙන් පසු ලාභය		109,940,047	60,170,921

ජාතික ලුණු සමාගම
2022 මාර්තු මස 31 දිනට ප්‍රධාන මූල්‍ය තත්ව
දත්ත පිළිබඳ ප්‍රකාශය

වත්කම්	සටහන්	2022	2021
		රු.	රු.
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත සහ උපකරණ	(8)	132,385,413	140,036,325
මූල්‍ය වත්කම්	(9)	-	136,365,944
		132,385,413	276,402,270
ජංගම වත්කම්			
තොග මූල්‍ය වත්කම්	(10)	21,663,605	48,970,652
බැංකු ස්ථාවර තැන්පතු	(9)	217,190,208	-
සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු	(11)	6,300,797	8,201,861
මුදල් හා බැංකු ශේෂයන්	(12)	61,675,028	16,887,208
මුළු වත්කම		306,829,638	74,059,721
		439,215,050	350,461,990
හිමිකම් සහ වගකීම්			
කොටස් ප්‍රාග්ධන සහ ව්‍යවස්ථාපිත සංචිත අරමුදල්			
ප්‍රකාශිත කොටස් ප්‍රාග්ධන	(13)	30,000,000	30,000,000
පුනර් ඇගයීම් කල සංචිත		2,400,000	2,400,000
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල්	(14)	317,628,963	231,088,916
මුළු හිමිකම්		350,028,963	263,488,916
ජංගම නොවන වගකීම්			
රාජ්‍ය මූල්‍ය ප්‍රධානයන්	(15)	50,106,618	58,256,865
විලම්බිත බදු බැරකම්	(16)	2,258,522	(612,236)
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	(17)	9,643,015	10,616,019
		62,008,155	68,260,648
ජංගම වගකීම්			
වෙළඳ හා සම්බන්ධ ගෙවීය යුතු	(18)	16,253,506	15,184,625
ගෙවිය යුතු ආදායම් බදු (ලැබිය යුතු)	(19)	10,924,427	3,527,801
		27,177,932	18,712,426
මුළු හිමිකම් සහ වගකීම්		439,215,050	350,461,990

සහතික කිරීම :

මෙම ප්‍රකාශනයන් 2007 අංක 07 දරණ සමාගම් පනතේ මූල්‍ය සහ අනුකූලතා නියම කර ඇති ආකෘතීන් හා අර්ථ දැක්වීම් වලට අනුකූලව සකස් කර ඇත.

අත්සන් කලේ

.....
වී. විනෝහරන්
මූල්‍ය කළමනාකරු
2022

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාමූහිකව වගකීමෙන් මෙම මූල්‍ය ප්‍රකාශයන් සහතික කර ඇති පරිදි ඉදිරිපත් කරමු.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මූල්‍ය සහ අනුකූලතා අනුව අනුමත කර අත්සන් කරමු.

අධ්‍යක්ෂවරුන්	අධ්‍යක්ෂවරු
අත්සන් කලේ	අත්සන් කලේ
.....	.....
ඒ.පී. මොරගොඩ	ඩබ්.පී. හපුආරච්චි

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමත කළ දිනය 2022.12.06

ජාතික ලුණු සමාගම

2022 මාර්තු මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ස්කන්ධ වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ප්‍රත්‍යගණිත සංචිත	ආදායම් සංචිත	එකතුව
	රු.	රු.	රු.	රු.
2020 වර්ෂයේ මාර්තු 31 දිනට ශේෂය	30,000,000	2,400,000	174,269,603	206,669,603
වාර්ෂික ශුද්ධ ලාභය			60,170,921	60,170,921
ලාභාංශ ගෙවීම			(3,351,608)	(3,351,608)
2021 වර්ෂයේ මාර්තු 31 දිනට ශේෂය	30,000,000	2,400,000	231,088,916	263,488,916
වාර්ෂික ශුද්ධ ලාභය			109,940,047	109,940,047
ලාභාංශ ගෙවීම			(23,400,000)	(23,400,000)
	30,000,000	2,400,000	317,628,963	350,028,963

ජාතික ලුණු සමාගම **2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය**		
මෙහෙයුම් කටයුතු වලින් මූල්‍ය ප්‍රවාහය	2022	2021
	රු.	රු.
බදු ගෙවීමට පෙර මෙහෙයුම ලාභය (පාඩුව)	130,991,933	70,168,530
ගැලපීම්		
ක්ෂය කිරීම සහ ක්‍රමක්ෂය	13,288,480	5,126,040
ක්‍රමක්ෂය	(8,150,249)	
පාරිතෝෂික ප්‍රතිපාදන	(214,884)	1,858,606
ස්ථිර තැන්පතු පොලි ආදායම	(6,612,175)	(4,874,173)
	(1,688,828)	2,110,473
කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර වාර්ෂික මෙහෙයුම් ලාභය	129,303,105	72,279,003
කාරක ප්‍රාග්ධනයේ වෙනස් වීම		
තොග සහ පරිලේඛනයන් හි වැඩිවීම (අඩුවීම)	27,307,046	33,230,174
වෙලඳ සහ අනෙකුත් පාර්ශවයන්ට ගෙවීම් (වැඩිවීම) අඩුවීම	1,078,380	(2,793,071)
වෙලඳ සහ අනෙකුත් පාර්ශවයන්ට ගෙවීම් වැඩිවීම (අඩුවීම)	1,068,880	1,806,780
	29,454,306	32,243,883
මෙහෙයුම් තුලින් ජනනය වූ මුදල්	158,757,410	104,522,886
පාරිතෝෂික ගෙවීම්	(758,120)	(609,015)
ආදායම් බදු/ රඳවාගැනීමේ බදු	(10,784,502)	(6,291,285)
	11,542,622	6,900,300
මෙහෙයුම් ක්‍රියාකාරිත්වයෙන් ගලා ආ ශුද්ධ මූල්‍ය	147,214,788	97,622,586

ආයෝජන කටයුතු වල මූල්‍ය ප්‍රවාහය		
දේපල, යන්ත්‍ර සහ උපකරණ	(2,672,800)	(5,019,975)
කෙරෙමින් පවතින වැඩ	(2,964,765)	
ආයෝජන ඉවත් කර ගැනීම	20,000,000	
ස්ථාවර තැන්පත් වල ආයෝජනය කිරීම	(95,000,000)	(136,365,944)
ස්ථාවර තැන්පත් වල පොලී ආදායම	1,610,596	4,874,173
	(79,026,969)	(136,511,747)
ආයෝජන ක්‍රියාකාරිත්වයන් ගලා ගිය ශුද්ධ මූල්‍ය ප්‍රවාහය		
මූල්‍ය ක්‍රියාකාරිත්වයන් මුදල් ප්‍රවාහය		
ලාභාංශ ගෙවීම	(23,400,000)	(3,351,608)
මූල්‍ය ක්‍රියාකාරිත්වයෙන් ගලා ආ ශුද්ධ මුදල් ප්‍රවාහය	(23,400,000)	(3,351,608)
වාර්ෂික කාල පරිච්ඡේදයේදී මුදල් සහ මුදල් වලට		
සමානයන්හි ශුද්ධ වර්ධනය		
මුදල් සහ මුදල් වලට සමානද වර්ෂ ආරම්භය	44,787,819	(42,240,768)
මුදල් සහ මුදල් වලට සමානද වර්ෂ අවසානයේ	16,887,208	59,127,977
	61,675,028	16,887,208
වර්ෂ අවසානයේදී මුදල් හා මුදල් වලට සමාන දෑ විශ්ලේෂණය කිරීම	61,675,028	16,887,208
බැංකුවේ ඇති මුදල්	61,675,028	16,887,208

ජාතික ලුණු සමාගම
2022 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. සංස්ථාපිත තොරතුරු

1.1 වාර්තාකරණ අස්තීත්වය

ජාතික ලුණු සමාගම යනු ශ්‍රී ලංකාවේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය (පූර්ණ වශයෙන් රජයට අයත්) යටතේ ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත සීමිත වගකීම් සහිත රාජ්‍ය ව්‍යාපාර සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 05, ඇලිවිටිගල මාවතේ 561/3 දරන ස්ථානයේ පිහිටා ඇති අතර, ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ග්‍රෑන්ඩ් බසාර්, මන්නාරම සහ අලිමංකඩ යන ස්ථානයන් හි පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වූයේ ශ්‍රී ලංකාවේ ලුණු නිෂ්පාදනයේ දීර්ඝ ඉතිහාසය ඉදිරියට ගෙන යාමයි. එම ආයතන සාමාන්‍ය ලුණු නිෂ්පාදනය කරන අතර ඒවා කැට ලුණු, සහ කාර්මික ලුණු ආකාරයට ශ්‍රී ලංකාව තුළ බෙදා හරිනු ලැබේ.

1.3 මූල්‍ය ප්‍රකාශනයේ අංක (05) සිට (26) දක්වා පිටුවල දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් ලෙස අඛණ්ඩව පවතී.

1.4 වර්ෂය අවසාන වන විට සේවක සංඛ්‍යාව 53 (2021-57)

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

2.1 සාමාන්‍ය ප්‍රතිපත්ති

2.1.1 අනුකූලතා ප්‍රකාශය

මෙම මූල්‍ය ප්‍රකාශය, ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ නිර්ණායකයන්ට අනුකූලව පිරිවැය මත පදනම්ව සකස් කර ඇත.

ජාතික ලුණු සමාගම
2022 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2.1.2 **සකස්කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශනය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශනය ශ්‍රී ලංකා රුපියල් (රු.) වලින් ඉදිරිපත් කරන අතර, ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරනු ලබන සියලු මූල්‍ය තොරතුරු ආසන්න රුපියලට දක්වා ඇත. සමාගමේ මූල්‍ය ප්‍රකාශයන් ඓතිහාසික පිරිවැය සම්මුතිය මත සකස් කර ඇත.

වර්තමාන නිරූපනය සමඟ සනාත කිරීම සඳහා අවශ්‍ය ව්‍යවස්ථාවන් හි වර්තමාන වර්ෂය සඳහා වන ඉදිරිපත් කිරීම් සමඟ ගැලපෙන පරිදි සංසන්දනාත්මක තොරතුරු අවශ්‍ය පරිදි නැවත වර්ගීකරණ කර නොමැති නම් සහ වෙනත් ආකාරයකින් ප්‍රකාශකර නැත්නම් සමාගම විසින් භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුරූප වේ.

2.1.3 **ඉදිරියට පවත්ගැන්ම**

අධ්‍යක්ෂවරුන් විසින්, සමාගම ඉදිරියට පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව තක්සේරුවක්කර ඇති අතර, ඔවුන් එය ඈවර කිරීමට හෝ වෙළඳාම නතර කිරීමට අදහස් නොකරයි.

2.1.4. **ඇස්තමේන්තු සහ නීන්දු භාවිතය**

ගිණුම්කරණ ප්‍රතිපත්ති යෙදවුම් සහ වාර්තා කරන ලද වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් සිදු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද කුඩා හා මධ්‍ය ප්‍රමාණයේ ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම කළමනාකාරීත්වයට අවශ්‍ය වේ. තථ්‍ය ප්‍රතිඵල ඇස්තමේන්තුගත ප්‍රතිඵලවලින් වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ පාදක වූ උපකල්පන පදනම් වී ඇත්තේ ඓතිහාසික අත්දැකීම් සහ තත්ත්වයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කෙරෙන අනාගත සිදුවීම් පිළිබඳ අපේක්ෂාවන් ඇතුළු විවිධ සාධක මතය.

ඇස්තමේනන්තු සහ පාදක වූ උපකල්පනයන් කටයුතු අඛණ්ඩව සිදුකරගෙන යන්නේ යැයි යන පදනම මත සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තු සංශෝධනය කරන ලද කාල පරිච්ඡේදය තුළ සහ බලපෑමට ලක්වන අනාගත කාල පරිච්ඡේදයන් තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා වන සංශෝධන හඳුනා ගැනේ.

2.1.5 **<u>වැදගත්කම් සහ සමූහණය</u>**

සමාන අයිතමවලින් යුතු සෑම ප්‍රමාණාත්මක පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ. ස්වභාවයෙන් හෝ ක්‍රියාකාරීත්වයෙන් අසමාන අයිතම ඒවා වැදගත් නොවේ නම් මිස වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

2.1.6 **<u>වාර්තාකරණ කාල පරිච්ඡේදයෙන් පසුව සිදු වී ඇති වැදගත් සිදුවීම්.</u>**

වාර්තාගත කරන ලද දිනට පසුව සිදු වී ඇති සිදුවීම් වල වැදගත්කම සලකා බලා ඇති අතර, අවශ්‍ය අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශනවල සුදුසු ගැලපීම් සහ අනාවරණය කිරීම් සිදු කර ඇත.

ඉදිරියට .....

ජාතික ලුණු සමාගම
2022 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය
ප්‍රකාශන සඳහා සටහන්

2.1.7 බදුකරණය

(අ) ප්‍රවර්තන බදු

බදු අය කිරීම සඳහා වන ගාස්තුව පදනම් වන්නේ, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූලව බදු අයකිරීම් භාණ්ඩ සඳහා ගැලපීම් කරන ලද වාර්ෂික ආදායම මත ය.

(ආ) විලම්බිත බදුකරණය

මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා භාවිතා කරණ ලද වත්කම් හා වගකීම් ප්‍රමාණයන් සහ බදුකරණ අරමුණු සඳහා භාවිතා කරන ලද ප්‍රමාණයන් අතර තාවකාලික වෙනස්කම් විලම්බිත බදුකරණය සඳහා සලකා බලනු ලැබේ. විලම්බිත බදු ගණනය, වාර්තා කිරීමේ කාලපරිච්ඡේදය අවසානයේදී සමාගම අපේක්ෂා කරන ආකාරයට සමාගමේ වත්කම් සහ වගකීම් ප්‍රමාණයන් පියවා ගැනීමට හෝ අයකරගැනීමට අනුගමනය කළ හැකි බදු ප්‍රතිවිපාක පිළිබිඹු කරයි.

ප්‍රවර්තන බදු වත්කම් සහ වගකීම් හිලව් කිරීමට නීත්‍යානුකූලව බලාත්මක අයිතියක් තිබේ නම් විලම්බිත වත්කම් සහ බැරකම් හිලව් කෙරෙන අතර, එකම බදු අධිකාරිය විසින් බදු අයකළ හැකි එකම බදු ඒකකය මත බදු ගෙවීමට අදාළ කිරීම හෝ විවිධ බදු ආයතන ශුද්ධ පදනමක් මත ප්‍රවර්තන බදු වගකීම් හා වත්කම් නිරවුල් කිරීමට ඔවුන් අදහස් කරයි නම් ඔවුන්ගේ බදු වත්කම් සහ වගකීම් එකවර නිරූපනය කරනු ලැබේ.

විලම්බිත බදු වත්කමක් ලෙස සලකන්නේ අනාගත තාවකාලික වෙනස්කම් සඳහා භාවිත කළ හැකි, භාවිතා නොකරන ලද බදු හානි සහ මට්ටමක් දක්වා අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා භාවිත කළ හැකි අනාගත බදු අයකළ හැකි ලාභයයි. වාර්තාකරණ සෑම දිනකදීම විලම්බිත බදු වත්කම් සමාලෝචනය කරනු ලබන අතර අදාළ ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීම තවදුරටත් සිදුවිය නොහැකි තරමට අඩු කරනු ලැබේ.
ඒවා ප්‍රතිවර්තනය කිරීමේදී තාවකාලික වෙනස්කම්වලට භාවිත කිරීමට බලාපොරොත්තු වන බදු අනුපාත කෙරෙහි, විලම්බිත බදු වත්කම් සහ බැරකම් ගණනය කිරීම සිදු කරනු ලබන්නේ වාර්තාකරනු ලබන දිනයට පෙර පනවන ලද හෝ ප්‍රමාණවත් ලෙස පනවන ලද නීති මත පදනම්ව වේ.

ජාතික ලුණු සමාගම
2022 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2.1.8 **ණය ගැණුම් පිරිවැය**

ණය ලබා ගැනීමේ පිරිවැය, කාල සීමාව තුළ දී ඔවුන් විසින් දරන ලද වියදමක් ලෙස හඳුනා ගැනේ.

2.2 **වත්කම් තක්සේරු කිරීම සහ එහි ගණනය කිරීමේ පදනම**

